දෙපාර්තමේන්තු චක්‍රලේඛ : 20/2019

මගේ අංකය : ඩී1/චක්‍රලේ/4
බන්ධනාගාර මූලස්ථානය.
කොළඹ 09.
2019.12. 24

සියළුම බන්ධනාගාර කොමසාරිස්,

බන්ධනාගාර අධිකාරි හා සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත,

<u>බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ විනය නිලධාරින්ගේ නිළ ඇඳුම් හා නිළ ලාංඡන භාවිතය සම්බන්ධවයි.</u>

බන්ධනාගාර ආඥා පනතට අදාලව හා බන්ධනාගාර නිත්‍ය නියෝගයන්ට අදාලව ආයතන අධ්‍යක්ෂ හා අමාත්‍යාංශ ලේකම්ගේ නියෝග ප්‍රකාරව, බන්ධනාගාර නිලධාරින්ගේ නිල ඇඳුම් හා නිල ලාංඡන සම්බන්ධයෙන් නිලධාරි නිලධාරිණියන් දැනුවත් කරමින් නිකුත් කර ඇති චක්‍රලේඛ වලට පටහැනිව තම අභිමතය පරිදි නිල ඇඳුම් හා නිල ලාංඡන භාවිතා කරන බවට කරුණු වාර්ථා වී ඇත.

විනය දෙපාර්තමේන්තුවක් වශයෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සියළු නිලධාරින් නීත්‍යානුකූලව තනතුරට අදාල නිල ඇඳුම් හා නිල ලාංඡන පැළඳිය යුතු අතර දෙපාර්තමේන්තුවේ අභිමානය හා කීර්තිනාමයට කැළලක් සිදු නොවන පරිදි කටයුතු කල යුතු බව අවධාරණය කර සිටිමි.

මේ සම්බන්ධයෙන් අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් අංක: MOJ/E22/විවිධ හා 2019.10.04 දාතමින් යුතු ලිපිය මගින් සියළුම බන්ධනාගාර නිලධාරින් තමන්ගේ තනතුරට අදාල නිල ඇඳුම භාවිතා කල යුතු බව දැනුවත් කරන ලෙසට මා වෙත දන්වා ඇත.

මේ අනුව, මින් ඉදිරියට වැඩ බලන හා වැඩ ආවරණය කරනු ලබන නිලධාරින්ද ඇතුළුව සියළුම බන්ධනාගාර නිලධාරින් තමන්ගේ නිත්‍ය තනතුරට අදාල නිල ඇඳුම් හා නිල ලාංඡන පමණක් භාවිතා කරන ලෙසට දැනුම් දෙන අතර මේ සම්බන්ධයෙන් ආයතන භාර නිලධාරින් තමන්ගේ නිලධාරි/නිලධාරිණියන් දැනුවත් කිරීමට පියවර ගන්නා මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ටී.එම්.ජේ.ඩබ්ලිව්.තෙන්නකෝන්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

2019.12. 24 දින.
බන්ධනාගාර මූලස්ථානය

ටී.එම්.ජේ.ඩබ්ලිව්. තෙන්නකෝන්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.